ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

අධ්‍යාපනවේදී (ස්වභාවික විද්‍යා)උපාධි වැඩසටහන-හයවන මට්ටම **2016/2017**

අවසාන පරීක්ෂණය - **2018**

නවයෞවනයන් සඳහා මනෝවිද්‍යාව - **ESU4301**

කාලය පැය තුනයි. **(03)**

---

දිනය - **2018.01.29** වේලාව -ප.ව.**01.30** - ප.ව.**04.30** දක්වා

---

**1 වන කොටසේ සියළුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## <u>1 වන කොටස</u>

01. හේතු තුනක් (03) සඳහන් කරමින් නව යෞවන අවධිය පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.

02. පරිණතවීමේ දී සිදුවන කායික වෙනස්වීම් නිසා නවයෞවනයන් තුළ ඇතිවිය හැකි ප්‍රතිඵල තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

03. නවයෞවනයන් තුළින් ප්‍රදර්ශනය වන කල්පිත නිගාමී තර්කනය සහ උද්ගාමී චින්තනයේ ස්වභාවය පැහැදිලි කරන්න.

04. සුදුසු උදාහරණ දෙකක (02) ආධාරයෙන් 'පෞරුෂය' යන සංකල්පයට ඔබගේ නිර්වචනයක් ලියා දක්වන්න.

05. නවයෞවනයන් තුළ ඇතිවන චිත්තවේග රටාවන්වල ස්වභාවය ළමා අවධියට වඩා වෙනස් ය. නවයෞවනයන්ට පොදු වූ සුවිශේෂී චිත්තවේගී රටාවන් දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. නවයෞවනයන් තුළ ඇතිවන අභිරුචි (interests) වර්ග තුනක් (03) සඳහන් කර ඉන් එකක ස්වභාවය පැහැදිලි කරන්න.

07. නවයෞවනයන් සහ දෙමාපියන් අතර ඇතිවන ගැටුම්වලට හේතු තුනක් (03) කෙටියෙන් විස්තර කරන්න.

08. නවයෞවනයන්ගේ සමාජීය කුසලතා සංවර්ධනය කිරීමට පාසල මඟින් ගත හැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 5 x 8 = 40)

## <u>2 වන කොටස</u>

09. (i) ප්‍රජානන සංවර්ධනය නිසා නවයෞවනයන් ලබා ගන්නා ප්‍රජානන ලක්ෂණ පහක් **(05)** සඳහන් කරන්න. (ලකුණු 05)

(ii) ඉහත දැක්වූ නව යෞවනයන්ගේ ප්‍රජානන ලක්ෂණ ප්‍රාථමික ළමුන්ගේ ප්‍රජානන ලක්ෂණ සමඟ සංසන්දනය කරන්න. (ලකුණු 05)

(iii) දෙමාපියන්ට නවයෞවනවියේදී සෞඛ්‍යමත් ප්‍රජානන සංවර්ධනයක් සුසාධ්‍යකරණය කිරීමට හැක්කේ කෙසේදැයි උදාහරණ තුනක් **(03)** දක්වමින් සාකච්ඡා කරන්න. (ලකුණු 10)

10. (i) නවයෞවනයන් අත්විඳින චිත්තවේගීය ගැටලු තුනක් **(03)** කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 06)

(ii) නවයෞවනයන්ගේ ඉහත සඳහන් කළ චිත්තවේගීය ගැටලු කාර්යක්ෂමව විසඳා ගැනීම සඳහා උපකාර කිරීමේදී ගුරුවරයාගේ කාර්යභාරය පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) ඉහත (i) හි සඳහන් කළ නවයෞවනයන්ගේ චිත්තවේගීය ගැටලු විසඳීමට දෙමාපියන්ට අනුගමනය කළ හැකි ක්‍රියාමාර්ග තුනක් **(03)** සාකච්ඡා කරන්න. (ලකුණු 06)

11. (i) පුද්ගලයෙකුගේ පෞරුෂ සංවර්ධනයට බලපාන සාධක තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) නවයෞවනයන්ගේ පෞරුෂ සංවර්ධනයට සමවයස් කණ්ඩායම් බල පාන්නේ කෙසේදැයි සාධක හතරක් **(04)** දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(iii) නවයෞවනයන්ගේ සමාජීය කුසලතා සංවර්ධනය කිරීමට ගුරුවරයෙකුට සංවිධානය කළ හැකි පන්තිකාමර ක්‍රියාකාරකම් තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 09)

12. ළමා අවධියේදී ඇති කර ගන්නා සමාජීය රටා නවයෞවන අවධියේදී ප්‍රතිසංවිධානය වේ.

(i) නවයෞවන අවධියේදී ප්‍රමුඛවන සමාජීය ලක්ෂණ තුනක් **(03)** සඳහන් කරන්න. (ලකුණු 03)

(ii) "සමවයස් කණ්ඩායම්වල භූමිකාව නවයෞවන අවධියේ සමාජානුයෝජනයේ දී ප්‍රමුඛ වේ." මෙම වගන්තිය විභාග කරන්න. (ලකුණු 05)

(iii) නවයෞවන අවධියේ සමාජීය සංවර්ධනය නිසා ඇතිවන පොදු ගැටලු දෙකක් **(02)** කෙටියෙන් සාකච්ඡා කරන්න. (ලකුණු 08)

(iv) ඉහත ගැටලු විසඳා ගැනීමට නවයෞවනයන්ට උපකාරීවීමේ දී දෙමාපියන්ගේ කාර්යභාරය විභාග කරන්න. (ලකුණු 04)

13. (i) 'අගයන්' යන සංකල්පය නිර්වචනය කරන්න. (ලකුණු 02)

(ii) නවයෞවනයන් තුළ ධනාත්මක අගයන් සංවර්ධනය කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) සුදුසු උදාහරණ හතරක් **(4)** දක්වමින් නවයෞවනයන් තුළ ධනාත්මක අගයයන් සංවර්ධනය කිරීමේ දී ගුරුවරයාගේ කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 12)

14. (i) ශ්‍රී ලංකාවේ නවයෞවනයන් අතර සියදිවි නසා ගැනීමේ ප්‍රමාණය ඉහළ මට්ටමක පවතී. මෙම තත්ත්වයට හේතුවන සාධක දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 08)

(ii) ඉහත සඳහන් කළ තත්ත්වය අවම කිරීමට දෙමාපියන්ට අනුගමනය කළ හැකි පියවර තුනක් **(03)** පැහැදිලි කරන්න. (ලකුණු 06)

(iii) ඉහත සඳහන් කළ තත්ත්වය වැළැක්වීමේදී පාසලේ කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

හිමිකම් ඇවිරිණි.

00005

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**FACULTY OF EDUCATION**

**BACHELOR OF EDUCATION (NATURAL SCIENCE)**

**DEGREE PROGRAMME**

**LEVEL - 06**

**FINAL EXAMINATION 2018**

**ESU4301 – PSYCHOLOGY OF THE ADOLESCENT**

**DURATION – THREE (03) HOURS**

Date: 29.01.2018 Time: 1.30 p.m. – 4.30 p.m.

**Answer All Questions in Part I and any three (03) questions from Part II.**

**PART - I**

01. Citing **three (03)** reasons, explain the importance of paying more attention on period of 'Adolescence'.

02. Explain briefly **three (03)** implications that may arise in adolescents due to the physiological changes occurred during maturation.

03. Explain the nature of Hypothetic deductive reasoning demonstrated by adolescents.

04. Write down your own definition for concept "personality" with the help of **two (02)** suitable definitions.

05. Emotional patterns in adolescence are different from those of childhood. Briefly explain, **two (02)** significant emotional patterns common in adolescence.

06. State **three (03)** types of interests in adolescents and explain the nature of any one of them.

07. Describe briefly, **three (03)** reasons for conflicts arise between adolescents and parents.

08. Explain **three (03)** strategies that can be taken by schools to develop social skills of adolescents.

(5 x 8 = 40 marks)

## PART - II

09. i. State **five (05)** cognitive characteristics that adolescents gain due to their cognitive development.

(05 marks)

ii. Compare the above cognitive characteristics of Adolescents with those of elementary school children.

(05 marks)

iii. Citing **three (03)** examples discuss how parents can facilitate healthy cognitive development during adolescence.

(10 marks)

10. i. Briefly describe, **three (03)** consequences of emotional problems experienced by adolescents.

(06 marks)

ii. Explain the teachers' role in helping adolescents to cope up their above mentioned emotional problems effectively.

(08 marks)

iii. Discuss **three (03)** strategies that parents can follow to solve emotional problems mentioned in above i. of adolescents.

(06 marks)

11. i. State **three (03)** factors that affect the personality development of an individual.

(03 marks)

ii. Explain by citing **four (04)** factors, how the influence of peer groups affect the personality development of adolescents.

(08 marks)

iii. Explain **three (03)** classroom activities that a teacher can organize to develop social skills in adolescents.

(09 marks)

12. The social patterns established during childhood undergo marked reorganization during adolescents.

    i. State **three (03)** social characteristics prominent in adolescence.

    (03 marks)

    ii. "Peers role is very prominent in socialization of adolescence". Examine this statement.

    (05 marks)

    iii. Briefly discuss **two (02)** common issues in social development in adolescence.

    (08 marks)

    iv. Examine the parents' role in helping adolescence to over come the above issues.

    (04 marks)

13. i. Define the concept 'values'.

    (02 marks)

    ii. Explain the importance of developing positive values in adolescents.

    (06 marks)

    iii. Citing suitable **four (04)** examples discuss the role of the teachers in developing positive values in adolescents.

    (12 marks)

14. i. In Sri Lanka, a high suicide rate is report among adolescents. Briefly explain **two (02)** reasons leading to this situation.

    (08 marks)

    ii. Explain **three (03)** measures that parents can follow to minimize the above mentioned situation.

    (06 marks)

    iii. Discuss the role of the school in preventing above mentioned situation.

    (06 marks)

*-Copyrights reserved-*